# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/66 - 2014 අගෝස්තු මස 29 වැනි සිකුරාදා - 2014.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ලංකා පටුන සමුද්‍රගිරි රජමහා විහාර පූජනීය ප්‍රදේශය පූජාභූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම**

අංක 1681/3 හා 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා අති විශෙෂ ගැසට් පත්‍රයේ
පළ කරන ලද නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1681/3 - 2010 නොවැම්බර් මස 22 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශෙෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ආචාර්ය දිසානායක මුදියන්සේලාගේ ජයරත්න වන මා හට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධනය විෂයය ප්‍රකාරව මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් බවටත් එය ''ලංකා පටුන සමුද්‍රගිරි රජමහා විහාර පූජාභූමිය'' යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ආචාර්ය දි.මු. ජයරත්න,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය.

2014 අගෝස්තු මස 20 වැනි දින,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

උපලේඛනය

***ලංකා පටුන සමුද්‍රගිරි රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

මිනින්දෝරු ජනරාල්ගේ 2011 මාර්තු මස 25 වැනි දින අංක Tri/ICH/2009/249A දරන සැලැස්මේ නිරූපිත නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොඩ්ඩියාර් පත්තු කොට්ඨාසයේ සීනන්වෙලී නම් ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටි පහත දැක්වෙන I වන කොටස, II වන කොටසෙහි දක්වා ඇති හෙක්ටයාර් 9.3214 ක් විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු ප්‍රදේශය.

*I කොටස*

**කැබලි අංක සී**

උතුරට : කැබලි අංක 1 බීඉසඩ්, ට්‍රි/ එස්ආර්ඩබ්ලිව්/ 2003 /248 දරණ සැලැස්මේ දැක්වෙන මාර්ගය සහ මුහුද;

නැගෙනහිරට : මුහුද;

දකුණට : බීඉසඩ් සහ කැබලි අංක ඩී;

බස්නාහිරට : ට්‍රි/ අයිසීඑච්/ 2003/248 දරණ සැලැස්මේ කැබලි අංක බී සහ ඩී ට්‍රි/ එස්ආර්ඩබ්ලිව්/ 2003/248 දරණ සැලැස්මේ කැබලි අංක බීඉසඩ්.

1A - G 20164 — 50 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*II කොටස*

**කැබලි අංක බී**

උතුරට : මුහුද, මුහුද දිගේ රක්ෂිත ප්‍රදේශය (කැබලි අංක ඒ) සහ කැබලි අංක බී සහ සී;

නැගෙනහිරට : කැබලි අංක සී සහ මුහුද;

දකුණට : මුහුද;

බස්නාහිරට : මුහුද සහ මාර්ගය.

09 - 489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.